**ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 182 -විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,145.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 963.31 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.මිලියන 182.23 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15.91 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 612.49 | 538.25 | 74.24 | 12.12 |
| මූලධන | 533.05 | 425.06 | 107.99 | 20.26 |
| එකතුව | **1,145.54** | **963.31** | **182.23** | **15.91** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 18201 සහ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.61 | 23.75 | 7.00 | 10.57 | 60.00 | 23.50 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂ එකතුව රු.18,925 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.18,375 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ රැකියා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 විසර්ජන ගිණුම

### 3.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 6 ක් සඳහා සළසා තිබුණු රු. මිලියනව 4.04 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබිම නිසා උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

විෂය අංක 18201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටි ණය ශේෂ එකතුව රු.585,808 ක් වී තිබුණි. වර්ෂ 01 ක සිට වර්ෂ 02 ක් දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.416,240 ක ණය ශේෂ 06 ක් හා වර්ෂ 4 කට වැඩි කාලයක සිට පැවත එන රු.57,140 ක ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

---

2012 ඔක්තෝබර් 05 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් රු.2,800,000 කට තක්සේරු කර තිබූ අමාත්‍යාංශයට අයත් වාහනයක් අපහරණය කිරීමට 2012 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2015 ඔක්තෝබර් 29 දින එම වාහනය වෙන්දේසි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) එම වාහනය රු.1,274,900 කට මිලදීගත් ගැණුම්කරු වෙත මිලදී ගන්නා අවස්ථාවේ දී වාහනයේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ නිලධාරීන් අපොහොසත් වීම නිසා ලබාගත් මුදල ආපසු එම ගැණුම්කරු වෙත ගෙවා තිබුණි.

(ii) 2012 වර්ෂයේ දී රු.2,800,000 කට තක්සේරු කළ යථෝක්ත වාහනය, අපහරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු නොකිරීම හේතුවෙන් 2014 ඔක්තෝබර් 01 දින වන විට රු.400,000 ක් දක්වා තක්සේරු අගය අඩු කර තිබුණි. 2015 ජුනි මාසය වන විටත් ඉහත වාහනය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී ඩෙල් ලැප්ටොප් පරිගණක ඌනතාවය සම්බන්ධයෙන් සහ අමාත්‍යාංශයට අයත් වාහනයක් අනතුරට පත්වීමෙන් ලැබී තිබුණ රු.86,748 ක රක්ෂණ වන්දිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104, 107, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 1,214 | 1,045 | 169 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 23 | 06 |
| | **එකතුව** | **1,255** | **1,079** | **176** |